**රත්මලාන විශ්වවිද්‍යාල විද්‍යායතනය - 2017**

**----------------------------------------------------**

වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත රත්මලාන විශ්වවිද්‍යාල විද්‍යායතනයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2014 අංක 01 දරන වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල විද්‍යායතන නියමාවලියේ 17(2) වගන්තිය හා 2008 අංක 31 දරන වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල පනතේ 47 (2) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විද්‍යායතනයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස විද්‍යායතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් විද්‍යායතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**----------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------

### 2.1 තත්ත්වාගණනය කළ මතය

-------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත රත්මලාන විශ්වවිද්‍යාල විද්‍යායතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-------------------------------------------

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

--------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 හා 2017 වර්ෂවලදී ප්‍රාග්ධන ප්‍රදාන යටතේ සේවක ධාරිතා ගොඩනැංවීම (Capacity Building) සඳහා විද්‍යායතනයට ලැබී වැයකර තිබූ එකතුව රු.1,589,998 ක් එක් එක් වර්ෂවල පුනරාවර්තන ආදායම් හා වියදම් ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට ප්‍රාග්ධන ප්‍රදාන ගිණුමට බැරකර දේපල පිරියත හා උපකරණ යටතේ ධාරිතා ගොඩනැංවීම ලෙස හර කර තිබීම හේතුවෙන් එම ගිණුම් එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 5,177,107 ක බැංකු අයිරාවක් පැවති නමුත් එම ශේෂය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වගකීම් යටතේ දැක්වීම වෙනුවට ජංගම වත්කම් යටතේ ඍණ ශේෂයක් ලෙස දක්වා තිබුණි.

(ඇ) විගණනයේ ගණනය කිරීම් අනුව 2017 දෙසැම්බර් 31 දිනට ප්‍රාග්ධන ප්‍රදාන ගිණුමේ ශේෂය රු. 295,549,228 ක් විය යුතු වුවද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව එම ශේෂය රු.323,848,000 ක් ලෙස දක්වා තිබූ අතර වෙනස වූ රු.28,298,772 ක් ජංගම නොවන වත්කම් යටතේ විලම්භිත ආදායමක් ලෙස දක්වා මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුලනය කර තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය තුලදී පුස්තකාල හා විද්‍යාගාර තැන්පතු සඳහා සිසුන් 245 දෙනෙකුගෙන් රු. 5,000 බැගින් රැස් කර ඉතිරිකිරීමේ ගිණුමක තැන්පත් කර තිබූ රු.1,225,000 ක් ගිණුම්වලින් අත්හැරී තිබුණි.

### 2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

-----------------------------------------------------------------------

පහත සඳහන් නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම් |
| --- | --- |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XIV පරිච්ඡේදයේ 4 ඡේදය | පුහුණු පාඨමාලාවල යෙදෙන නිලධාරීන් සඳහා ආයතන සංග්‍රහයේ 4.1.1 ඡේදය ප්‍රකාරව සංයුක්ත දීමනා හා ගමන් වියදම් දීමනා ගෙවීම වෙනුවට අවස්ථා 03කදී ආහාර හා නවාතැන් වෙනුවෙන් වැය වූ රු. 38,269 ක් ප්‍රතිපූර්ණය කර තිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>මුදල් රෙගුලාසි 381 | රාජකාරී බැංකු ගිණුමක් ආරම්භ කිරීම සඳහා ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා මාර්ගයෙන් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීමක් කළ යුතු වුවද, විද්‍යායතනය විසින් එපරිදි කටයුතු කිරීමකින් තොරව සිසුන්ගෙන් ලද පුස්තකාල හා විද්‍යාගාර පහසුකම් තැන්පතු සඳහා වෙනම ගිණුමක් ආරම්භ කර තිබුණි. |
| (ඇ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | |
| (i) 7.4.5 වගන්තිය | සමාලෝචිත වර්ෂය සඳහා විද්‍යායතනයෙහි ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් භාණ්ඩ සමීක්ෂණයක් සිදු කර නොතිබුණි. |
| (ii) 8.10 (ඇ) වගන්තිය | 2017 දෙසැම්බර් මාසයේ දී විද්‍යායතනය විසින් රු.884,029 ක බැංකු අයිරා පහසුකම් ලබා ගෙන ඒ වෙනුවෙන් රු.1,732 ක අයිරා පොලියක් ගෙවා තිබුණු නමුත් චක්‍රලේඛය ප්‍රකාරව ණය සීමා අනුමත කර ගැනීම සිදුකර නොතිබුණි. |

## 2.4 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ජාතික වෘත්තීය සුදුසුකම (NVQ) 5,6 මට්ටමේ ඩිප්ලෝමා පාඨමාලා පැවැත්වීමේ අරමුණින් පිහිටුවන ලද මෙම විද්‍යායතනය, විධිමත් අනුමැතියකින් තොරව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හා ජාතික වෘත්තීය සුදුසුකම (NVQ) 7 පාඨමාලා සඳහා නිකුත් කරන චක්‍රලේඛ පදනම් කරගනිමින් බාහිර කථිකාචාර්ය දේශණ ගාස්තු, සිසුන්ගේ විභාග ප්‍රශ්න පත්‍ර සැකසීම සඳහා වූ ගාස්තු සහ මාණ්ඩලික හා මාණ්ඩලික නොවන ශ්‍රේණි සඳහා නිලධාරීන් බඳවා ගැනීමට පවත්වන සම්මුඛ පරීක්ෂණ සඳහා වූ ගාස්තු ලෙස වර්ෂය තුළ එකතුව රු.1,598,025 ක් ගෙවීම් කර තිබුණි.

(ආ) ගෙවීම් සඳහා විධිමත් ක්‍රමවේදයක් අනුමත කර ගැනීමකින් තොරව පාලක මණ්ඩලයේ අනුමැතිය මත පමණක් ප්‍රශ්ණ පත්‍ර සකස් කිරීම, පිළිතුරු පත්‍ර ලකුණු කිරීම හා විභාග

රාජකාරී සඳහා සමාලෝචිත වර්ෂය වෙනුවෙන් කාර්ය මණ්ඩලය වෙත රු. 975,400 ක් ගෙවා තිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විද්‍යායතනයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 8,511,971 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 529,712 ක් වූයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේදී මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.9,041,683 ක පිරිහීමක් පෙන්නුම් කෙරිණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ සේවක පිරිවැය රු.10,643,215 කින් හා සේවා වියදම් රු.4,079,118 කින් ඉහල යාම ඉහත පිරිහීම සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්යසාධනය**

**4.1.1 සැලසුම් කිරීම**

2017 වර්ෂය සඳහා පිළියෙල කරන ලද ප්‍රසම්පාදන සැලැස්මෙන් බැහැරව විද්‍යායතනය විසින් රු. 6,668,815 ක් වටිනා උපකරණ හා සේවා ලබා ගෙන තිබුණෙන් ප්‍රසම්පාදන සැලැස්ම කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

**4.1.2 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විද්‍යායතනයෙහි පවත්වාගෙන යන පාඨමාලා 10 ක් සඳහා සිසුන් 300 දෙනෙකු පමණ බඳවා ගැනීමට හැකියාව පැවතිය ද සමාලෝචිත වර්ෂයේ දී සිසුන් 245 දෙනෙකු පමණක් බඳවාගෙන තිබුණු අතර ඉන් සිසුන් 38 දෙනෙකු පාඨමාලා හැර ගොස් තිබුණි.

(ආ) පාඨමාලා 2ක් හැරුණු විට අනෙකුත් පාඨමාලා 08 සඳහා කථිකාචාර්යවරුන් දෙදෙනෙකු බැගින් බඳවාගෙන තිබූ අතර සහ සමාලෝචිත වර්ෂය සඳහා බාහිර කථිකාචාර්යවරුන් වෙනුවෙන් රු.2,425,050 ක් වියදම් දරා තිබුණි. එහෙත් සමාලෝචිත වර්ෂයේ නිකුත් කරන ලද විභාග ප්‍රතිඵල අනුව ඇතැම් විෂයයන් වලට අදාලව සිසුන්ගේ සමත්වීමේ ප්‍රතිශතයෙහි අඩුවීමක් නිරීක්ෂණය වූ අතර නියැදි පරීක්ෂාවට අනුව විෂයයන් 20 කට අදාලව සමත් සිසුන්ගේ ප්‍රතිශතය සියයට 10 සිට සියයට 66 දක්වා වූ පරාසයක පැවතුණි.

(ඇ) නිපුණතා ආංශික සංවර්ධන ව්‍යාපෘතිය යටතේ සමාලෝචිත වර්ෂය වෙනුවෙන් කාර්යයන් 10 ක් සඳහා අවස්ථා 02 කදී එකතුව රු.මිලියන 29 ක ප්‍රතිපාදන අනුමත කර තිබුණද වර්ෂය තුලදී රු.15,669,696 ක් පමණක් ව්‍යාපෘතියෙන් ලබා දී තිබුණි. කෙසේ වුවද, කාර්යයන් 2 ක් සඳහා වෙන් කල ප්‍රතිපාදනය ඉක්මවා වැය කර තිබූ අතර රු.1,450,000 ක් වැයකර

ගිණුම්කරණ මෘදුකාංගයක් මිළදී ගැනීමට හා අනාරක්ෂිතව පැවති විද්‍යායතන ගොඩනැගිල්ලේ සිවිලිම පිළිසකර කිරීම සඳහා සැලසුම් කර තිබුණද එකී කාර්යයන් ඉටුකර නොතිබුණි.

(ඇ) විගණන නියැදි පරීක්ෂාවේදී විෂයයන් 18 කට අදාලව සැලසුම් කල දේශණ පැය ගණනින් සම්පූර්ණ කර තිබූ පැය ගණන සියයට 18 සිට සියයට 45 දක්වා වූ පරාසයක පැවතුණි. ඒ අනුව පාඨමාලාවලට අදාලව ඇතැම් විෂයයන් (Module) සම්බන්ධයෙන් ආවරණය කිරීමට සැලසුම්කල දේශණ පැය ගණන දේශකයන් විසින් සම්පූර්ණ කර නොතිබුණු බව නිරීක්ෂණය වූ අතර සමාලෝචිත වර්ෂයේදී බාහිර කථිකාචාර්යවරුන්ට දේශණ පැය 664 ක් ලබාදී ඒ වෙනුවෙන් රු.795,050 ක වැයකර තිබුණි. සැලසුම් කල දේශන පැය ගණන ආවරණය නොකිරීම හේතුවෙන් සිසුන්ට විෂය සම්බන්ධයෙන් ප්‍රමාණවත් දැනුමක් ලැබුණේද යන්න හා පාඨමාලාවල ගුණාත්මකභාවය සම්බන්ධයෙන් විගණනයේදී ගැටළු සහගත විය.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) නිපුණතා ආංශික සංවර්ධන ව්‍යාපෘතිය යටතේ සිසුන් වෙත බෙදාහැරීම සඳහා 2015 අප්‍රේල් 27 දින විද්‍යායතනයට ලබා දී තිබූ රු. 449,938 ක් වටිනා ටී ෂර්ට් 737 ක් අතුරින් විගණිත දිනය වූ 2018 පෙබරවාරි 26 දින වනවිටත් රු. 205,738 ක් වටිනා ටීෂර්ට් 337ක් නිකුත් නොකර ගබඩාවේ රඳවාගෙන තිබුණි.

(ආ) විද්‍යායතනයේ සිසුන්ගේ සමාසිකය අවසානයේ පවත්වනු ලබන විභාගවලින් ප්‍රතිඵල අවම වශයෙන් මාසයක් ඇතුළත ප්‍රකාශයට පත් කිරීමට සැලසුම් කර තිබුණද, 2016 හා 2017 වර්ෂයන්හි පැවති විභාගවල ප්‍රතිඵල සැලසුම් කල දිනට නිකුත් කිරීමට විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය අපොහොසත් වී තිබුණු අතර ප්‍රතිඵලවල ප්‍රමාදය මාස 03 සිට මාස 12 දක්වා පරාසයක පැවතුණි. සමීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයින් විසින් පිළිතුරු පත්‍ර පරීක්ෂා කර ආපසු ලබාදීමේ විශාල ප්‍රමාදයක් පැවතීම ඒ සඳහා හේතුවී තිබූ අතර නියැදි පරීක්ෂාවට අනුව විගණිත දිනය වූ 2018 මාර්තු 31 වනවිට එම ප්‍රමාදය මාස 03 සිට මාස 08 දක්වා වූ පරාසයක පැවතුණි.කෙසේ වුව ද, පිළිතුරු පත්‍ර පරීක්ෂා කිරීම සඳහා අභ්‍යන්තර කථිකාචාර්යවරුන්ට ගෙවීම් කර තිබූ අතර එම කාලය සඳහා කථිකාචාර්යවරුන් වෙත රාජකාරී නිවාඩුද අනුමත කර තිබුණි.

(ඇ) 2016 වර්ෂයේ අස්ථානගත වූ රු.125,000 ක් වටිනා ඩිජිටල් බහු මීටරයේ අලාභය වන රු.102,908 ක් අයකර ගැනීමට මෙතෙක් කළමනාකරණයේ අවධානය යොමු වී නොතිබුණි.

(ඈ) විද්‍යායතනය පවත්වාගෙන යනු ලබන රූඩ් 03 පර්චස් 3.9 ක් විශාල ඉඩමේ නීත්‍යානුකුල හිමිකම සමාලෝචිත වර්ෂය අවසානය වනවිටත් විද්‍යායතනය වෙත පවරාගැනීමට සහ එහි වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

## 4.3 කාර්ය මණ්ඩල පරිපාලනය

----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විද්‍යායතනයේ ප්‍රධාන විධායක නිළධාරී හා ආධුනික කථිකාචාර්ය තනතුරු හැරුනු කොට අනෙකුත් තනතුරු සඳහා බඳවා ගැනීමේ පරිපාටියක් අනුමත කරවා ගෙන නොතිබුණු අතර වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ බඳවා ගැනීමේ පරිපාටිය අනුව බඳවා ගැනීම් සිදුකර තිබුණි. එහෙත්, වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ බඳවාගැනීමේ පරිපාටිය තුලද ඇතුලත් නොවූ ඉංග්‍රීසි ගුරු උපදේශක හා නඩත්තු තාක්ෂණික යන තනතුරු සඳහා බඳවාගැනීමේ පටිපාටියකින් තොරව නිලධාරීන් දෙදෙනෙකු බඳවාගෙන තිබුණි.

(ආ) බඳවාගැනීමේ පරිපාටියට අනුව විද්‍යායතනයේ නිළධාරීන් හතර දෙනෙකුගේ සුදුසුකම් අදාල ආයතන වෙතින් සනාථ කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) බඳවා ගැනීමේ පරිපාටිය ප්‍රකාරව, ආධුනික කථිකාචාර්යවරුන් බඳවා ගැනීමේදී උගන්වනු ලබන විෂය සම්බන්ධයෙන් ප්‍රථම හෝ දෙවන පෙළ ඉහළ සාමාර්ථයක් පැවතීම හෝ අදාල විෂය ක්ෂේත්‍රයෙන් බැහැර උපාධියක් වනවිට විෂය ක්ෂේත්‍රයට අදාල පර්යේෂණ නිබන්ධනයක් සහිත වසර 2 ක පශ්චාත් උපාධියක් තිබිය යුතු බව දක්වා තිබුණි. එහෙත්, විද්‍යායතනය මගින් පවත්වනු ලබන සිද්ධි කළමනාකරණ, ඉලෙක්ට්‍රිකල් තාක්ෂණය, රූපලාවන්‍ය හා රූපවාහිනී වැඩසටහන් තාක්ෂණය යන පාඨමාලා සඳහා සමාලෝචිත වර්ෂයේදී සහ ඉකුත් වර්ෂවලදී අදාල විෂය ක්ෂේත්‍රයේ නොවන උපාධි සහිත කථිකාචාර්යෙවරුන් 4 දෙනෙකු බඳවා ගෙන තිබූ නමුත් එම කථිකාචාර්යවරුන් විසින් බඳවා ගැනීමේ පරිපාටිය ප්‍රකාරව තිබිය යුතු පශ්චාත් උපාධි අවශ්‍යතාවය සපුරා නොතිබුණි.

(ඈ) විදුලි සංදේශ තාක්ෂණය (Telecommunication Technology) පාඨමාලාව සඳහා 2016 ජුනි 01 දින බඳවාගත් විදේශ උපාධියක් සහිත කථිකාචාර්යවරයාගේ බඳවාගැනීමේ පරිපාටිය අනුව තිබිය යුතු සුදුසුකම් අදාල උපාධි ආයතනය වෙතින් සනාථ කර ගෙන නොතිබුණු අතර එම විශ්වවිද්‍යාලය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක්ද යන්න සනාථ කරගෙන නොතිබුණි.

(ඉ) ආහාර තාක්ෂණය (Food Technology) පාඨමාලාව සඳහා 2014 නොවැම්බර් 01 දින බඳවා ගෙන තිබූ කථිකාචාර්යවරියගේ බඳවාගැනීමේ පටිපාටිය අනුව තිබිය යුතු සුදුසුකම් සනාථ කරගැනීමට අදාල තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරිණි.

(ඊ) විද්‍යායතනයේ කථිකාචාර්යවරියක් පශ්චාත් උපාධියක් හැදෑරීම සඳහා විදේශගතව ඇති අතර එම නිලධාරිනිය වෙනුවෙන් ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය මගින් මෙහෙය වන පාඨමාලාවක් සඳහා පාඨමාලා ගාස්තුව වශයෙන් රු. 40,000 ක් විද්‍යායතනය විසින් ගෙවා තිබුණද විදේශගත වන විට මෙම නිලධාරිනිය එම පාඨමාලාව සම්පූර්ණ කර නොතිබුණු බැවින් එම මුදල් ආපසු අයකර ගැනීම කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි.

## 5. තිරසාර සංවර්ධනය

---------------------

### 5.1 තිරසාර සංවර්ධන අරමුණු ලඟා කර ගැනීම

---------------------------------------------------

2017 අගෝස්තු 14 දිනැති අංක එන්පී/එස්පී/එස්ඩීජී/17 දරන තිරසාර සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් නිකුත් කරන ලද ලිපිය හා තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර "2030 න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයට අදාලව විද්‍යායතනය තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී නොතිබීම හේතුවෙන් තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ලඟා විය යුතු සන්ධිස්ථානයන්ද ඉලක්ක මත ලඟා වීම් මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 6. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

---------------------------------------

### 6.1 විගණන කමිටු

-----------------

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.1 වගන්තිය ප්‍රකාරව විගණන කමිටුවක් පිහිටුවා නොතිබුණි.

### 6.2 ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

---------------------------------------------

#### 6.2.1 ප්‍රසම්පාදනයන්

----------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.2.2 ඡේදය ප්‍රකාරව ජාතික තරඟකාරී ක්‍රමයට ලංසු කැඳවීමේ දී අවම වශයෙන් දින 21 ක් වත් ලංසුපත් කැඳවීම සඳහා විවෘතව පැවතිය යුතු වුව ද, 2017 අප්‍රේල් 09 දින විද්‍යාගාර වෙනුවෙන් ලීබඩු හා උපකරණ මිලදීගැනීම සඳහා පළ කරන ලද ප්‍රසම්පාදන දැන්වීමෙහි එම දින ගණන 19 ක් වූයෙන් නැවත එම දින සංශෝධනය කරමින් පුවත්පත් දැන්වීමක් පළ කිරීම සඳහා රු. 15,425 ක නිෂ්කාර්ය වියදමක් දරා තිබුණි.

(ආ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.6 ඡේදය ප්‍රකාරව ලංසු කැඳවීමේ ලේඛනවල කෙටුම්පත් කල පිරිවිතර අන්තර්ගත කල යුතු වුවත් ඊට පටහැනිව පිරිවිතර තීරණය කිරීමකින් තොරව වර්ෂය තුල අවස්ථා 05කදී රු. 1,631,421 ක් වටිනා භාණ්ඩ මිලදී ගෙන තිබුණි.

(ඇ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.6.1 ඡේදය ප්‍රකාරව, ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් පිළියෙල කරන ලද ලංසු කැඳවීමේ ලේඛණ තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් සමාලෝචනය කර අනුමත කල යුතු වුවද ලංසු ලේඛණ නිකුත් කිරීමෙන් පසුව තාක්ෂණික ඇගයීම් කමිටු පත්කර තිබීම හේතුවෙන් අවස්ථා 4 කදී සිදු කරන ලද එකතුව රු.1,002,062 ක ප්‍රසම්පාදනයන් සම්බන්ධයෙන් භාවිතා කර තිබුණු ලංසු ලේඛන ඇගයීම් කමිටුවේ පරික්ෂාවට ලක්වී නොතිබුණි.

(ඈ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.8.4 ඡේදයේ සඳහන් පරිදි තාක්ෂණික පිරිවිතරවල බරපතල ස්වභාවයේ වෙනස්කම් විශාල බැහැරවීම් ලෙස සලකා ක්‍රියාකල යුතු වුවද තාක්ෂණික පිරිවිතර නිසි පරිදි ඇගයීමකින් තොරව හා ඉදිරිපත් කර තිබූ පිරිවිතරවලින් බැහැරව 2017 දෙසැම්බර් 19 දින රු. 541,650 ක් වටිනා ඩුප්ලෝ මැෂින් යන්ත්‍රයක් මිලදී ගෙන තිබුණි.

(ඉ) විද්‍යායතනයට අයත් රූපලාවන්‍ය (Cosmetology) විද්‍යාගාරය ප්‍රතිසංස්කරණය හා උපකරණ සවිකිරීමට අදාල රු.1,128,840 ක් වූ ප්‍රසම්පාදනයේදී ලංසු විවෘත කිරීමේ කමිටුවට සාමාජිකයන් පත්කිරීම 2017 දෙසැම්බර් 09 දින සිදුකර තිබියදී, 2017 දෙසැම්බර් 06 දින ලංසු විවෘත කර තිබුණි. ඒ අනුව ප්‍රසම්පාදන ක්‍රියාවලියේ විනිවිදභාවය පිළිබඳ විගණනයේදී ගැටළුකාරී විය.

(ඊ) පවිත්‍රතා සේවාව සඳහා විද්‍යායතනය විසින් මිල ගණන් කැඳවා තිබුණු අතර අවම ලංසුව ඉදිරිපත් කල ආයතනය එවකට විද්‍යායතනයේ පවිත්‍රතා සේවාව පවත්වාගෙන ගොස් තිබූ නමුත් එම ආයතනයේ සේවාව අසතුටුදායක වීම හේතුවෙන් එම ලංසුව ප්‍රතික්ෂේප කර තිබුණි. තවද, විද්‍යායතනය විසින් ලංසු ලේඛනවල අදාල පිරිවිතර කිසිවක් ඇතුලත් කර නොතිබියදී රු.1,706,400 ක්වූ දෙවැනි අවම ලංසුව ඉදිරිපත් කල ආයතනයේ ලේඛනවල, රසායනික හා අනෙකුත් උපකරණ සම්බන්ධයෙන් ලබා දී තිබූ තොරතුරු විස්තීර්ණ හා විස්තරාත්මක නොවන බව දක්වමින් එයද ප්‍රතික්ෂේප කර තිබුණි. කෙසේ වුවද, වැඩිම ලංසුව වූ රු.2,651,100 ක් ඉදිරිපත් කල ආයතනයට කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි.

## 7. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | ගෙවීම් වවුචර් නියමිත පරිදි පිළියෙල නොකිරීම, ගිණුම් පොත්පත් හා ලේඛන යාවත්කාලීනව පවත්වාගෙන යාමට කටයුතු නොකිරීම. |
| (ආ) | වත්කම් කළමනාකරණය | වත්කම් ගිණුම් තැබීම හා ලේඛන පවත්වා නොගැනීම. |
| (ඇ) | කාර්යමණ්ඩල බඳවා ගැනීම් හා පරිපාලනය | කාර්ය මණ්ඩල බඳවා ගැනීම් විධිමත්ව සිදු නොකිරීම හා ලිපිගොනු යාවත්කාලීනව පවත්වාගෙන යාමට කටයුතු නොකිරීම. |
| (ඇ) | කොන්ත්‍රාත් පරිපාලනය | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු නොකිරීම. |